"සියුමැලි දෑතෙන් දොඹකර ක්‍රියා කරවන කොළඹ වරායේ යකඩ ලියන්" යන සිරස්තලයෙන් යුතුව, සිළුමිණ පුවත්පතේ (අප්‍රේල් 02, 2023) ලිපියක් පළවී තිබිණි. එය, කොළඹ වරායේ දොඹකර ක්‍රියාකරවන්නියන් සමඟින් කළ සාකච්ඡාවක් ඇසුරින් ලියැවී ඇත.
වර්තමාන ලෝකය තුළ පුළුල්ව සාකච්ඡාවට ලක් වන කරුණක් වන්නේ, ශ්‍රම දායකත්වය තුළ ද පැවතිය යුතු ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයයි. එහිදී, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව වෙනස්කමක් නොමැතිව, සියළු දෙනාට සමාන අවස්ථාවන් තිබීම, සමාන සම්පත් සඳහා ප්‍රවේශයක් තිබීම සහ සමාන වේතනයන් ලැබීම යන කරුණු සැළකිල්ලට ගැනේ.
ඒ අනුව, දොඹකර ක්‍රියාකරවීම වැනි රැකියාවක් තුළ කාන්තා නියොජනය පැවතීම සම්බන්ධයෙන් ධනාත්මක ස්වරයකින් මෙම ලිපිය ලියැවී තිබීම ප්‍රශංසනීය වේ.
කෙසේ නමුත්,
1) මෙම ලිපියේ සිරස්තලයෙන් දැක්වී ඇති ආකාරයට, "සියුමැලි දෑත්" යන හැඳින්වීම ඔස්සේ, කාන්තාව යනු "සියුමැලි" වැඩට පමණක් උචිත කොටසක් ලෙසින් ඔවුන්ව ඒකාකෘතික කිරීමක් සිදු වේ යැයි ඔබ සිතන්නේ ද?
2) ඒ ඔස්සේ, ඇතැම් වෘත්තීන් කාන්තාවන්ට නොගැලපෙන බවක් අදහස් නොවන්නේ ද?
මූලාශ්‍ර:
https://gsdrc.org/topic-guides/gender/gender-and-media/
https://www.un.org/sustainabledevelopment/gender-equality/
https://www.wgea.gov.au/about/workplace-gender-equality
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ වෘත්තීන් ඒකාකෘතික කිරීම අවශ්‍යද?

